*සැ. යු.* - 2022.09.23 වැනි දින පළ කරන ලද අංක 2299 දරන ගැසට් පත්‍රයේ I/II (අ) සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,300 - 2022 සැප්තැම්බර් මස 30 වැනි සිකුරාදා - 2022.09.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 1684 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1685 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1689 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1693 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 ඔක්තෝබර් මස 21 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 ඔක්තෝබර් මස 07 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ලංසු සඳහා ආරාධනයයි

### ශ්‍රී ලංකා දුම්රිය සේවය

ශ්‍රී ලංකා දුම්රිය සේවයේ කඩුගන්නාව අංගනයේ චෙක් රේල්ඩ් මාර්ගය (Check Railed Track) : සඳහා EN 45 E1 රේල්පීලිවලට ගැළපෙන අඩු උස කොන්ක්‍රීට් සිල්පර 4000ක් සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය.

IFB අංක SRS F. 7879

01. කොළඹ ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවයට කඩුගන්නාව අංගනයේ චෙක් රේල් මාර්ගය (Check Railed Track) සඳහා EN 45 E1 රේල් පීලිවලට ගැළපෙන අඩු උස කොන්ක්‍රීට් සිල්පර 4,000 ක් සැපයීම සඳහා දේශීය නිෂ්පාදකයින්/සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

02. ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය මගින් මෙහෙයවනු ලැබේ.

03. අභිලාෂී යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්හට, **2022.09.23** වැනි දින සිට **2022.10.17** දින දක්වා කාර්යාල දිනයන්හි පෙ. ව. 9.00 සිට ප. ව. 3.00 දක්වා පහත සඳහන් ලිපිනයේ දී වැඩිමනත් තොරතුරු ලබාගැනීමටත්, ලංසුකරණ ලිපිලේඛන පරීක්ෂා කර බැලීමටත් පිළිවන.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ප්‍රසම්පාදන),
දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,
ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.

දුරකතන අංක : 94 (11) 2438078 හෝ 94 (11) 2436818
ෆැක්ස් අංකය : 94 (11) 2432044
විද්‍යුත් තැපැල : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

04. ලංසුකරු පසුගිය වසර පහ (05) ඇතුළත ශ්‍රී ලංකා දුම්රිය සේවයට කොන්ක්‍රීට් සිල්පර 4,000 ට වැඩි සංඛ්‍යාවක් හෝ පෙරැදි (Pre - Stressed) කොන්ක්‍රීට් බාල්ක, රු. මිලියන 50 ට වැඩි අගයකට සපයා තිබිය යුතු ය. නැතහොත් පෙරැදි කොන්ක්‍රීට් කණු රු. මිලියන 500 කට වැඩි අගයකට සපයා තිබිය යුතු ය. ඉන්වොයිස් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

05. ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ප්‍රසම්පාදන උපදෙපාර්තමේන්තු කාර්යාල ලිපිනය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවන රු. 30,500.00 ප්‍රසම්පාදන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2022.09.23 දින සිට 2022.10.17 දින ප. ව. 3.00 තෙක් ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් අභිලාෂී ලංසුකරුවන්ට ලබාගත හැකිය.

06. සියලුම ලංසු සමග ලංසු සුරක්ෂණයක් එවිය යුතු ය. ලංසු සුරක්ෂණ මුදල රු. 1, 700,000.00 විය යුතු අතර, එය ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අනුමත ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන බැංකුවකින් ලබාගත් කොන්දේසි විරහිත ඇපකරයක් විය යුතු ය.

07. ලංසු **2022.10.18 දින ප. ව. 2.00** ට හෝ ඊට පෙර පහත ලිපිනයට ගෙනැවිත් භාර දිය යුතු ය. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කෙරෙන අතර, ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට එම අවස්ථාවට සහභාගි විය හැකිය. ප්‍රමාද ලංසු භාරගනු නොලැබේ.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුව,
ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
ඕල්කොට් මාවත, කොළඹ 10.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය SRS/F.7879

09-424

# බඩු බාහිරාදිය විකිණීම්

**මහෙස්ත්‍රාත් අධිකරණය - මීගමුව**

අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ රාජසන්තක වූ භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම - 2022 (03)

මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණය භාරයට පත් රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් නොපාන ලද පහත සඳහන් භාණ්ඩ 2022.10.15 වැනි දින පෙ. ව. 9.45 ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් සඳහා හිමිකම් කියන අයෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර හෝ වෙන්දේසිය පැවැත්වෙන දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ නිසි අවසරය ලබාගෙන වෙන්දේසිය පැවැත්වීමට පැය භාගයකට පෙර භාණ්ඩ පරීක්ෂා කළ හැක.

04. වෙන්දේසියේ දී මිලදී ගනු ලබන භාණ්ඩයන් සඳහා ඉල්ලුම්කරු විසින් වෙන්දේසි අවස්ථාවේදී ම මුදල් ගෙවිය යුතු අතර, සියළුම ගෙවීම් මුදලින් ම ගෙවිය යුතු ය. මේ සඳහා චෙක්පත් භාරගනු නොලබන අතර මිලදී ගත් භාණ්ඩ එදින ම අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

05. වෙන්දේසි භාණ්ඩ ඉල්ලුම්කරුවන් සහ ගැණුම්කරුවන් තම අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වෙනත් පිළිගත හැකි හැඳුනුම්පතක් ඉදිරිපත් කළ යුතු අතර, ඉදිරිපත් කිරීමට නොහැකි වන්නන් හට වෙන්දේසි භූමියට ඇතුල්වීමට අවසර දෙනු නොලැබේ.

06. අධිකරණය විසින් කරනු ලබන ලන්සුව නොපිළිගන්නා අවස්ථාවක දී ගරු අධිකරණයේ අභිමතය පරිදි වෙන්දේසිය සඳහා ඉදිරිපත් කළ භාණ්ඩ ඉවත් කර ගැනීම හා අවලංගු කිරීමේ බලය අධිකරණය සතු ය.

චම්පික රාජපක්ෂ,
මහෙස්ත්‍රාත්/අතිරේක දිසා විනිසුරු.

2022 අගෝස්තු මස 18 වැනි දින,
මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණයේ පැවැත්වීමට නියමිත ප්‍රසිද්ධ වෙන්දේසියේ වෙන්දේසි කිරීමට නියමිත නඩු භාණ්ඩ 2022 (03)**

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | AR 195/19 | BAJ 1798 යතුරුපැදි | 01 |
| 02. | AR 3455/19 | UT 6836 යතුරුපැදි | 01 |
| 03. | AR 3066/16 | HC 7522 යතුරුපැදි | 01 |
| 04. | AR 2200/20 | GC 3649 යතුරුපැදි | 01 |
| 05. | AR 250/20 | VY 6202 යතුරුපැදි | 01 |
| 06. | AR 2255/21 | BCR 4442 යතුරුපැදි | 01 |
| 07. | AR 2254/21 | BFN 8160 යතුරුපැදි | 01 |
| 08. | AR 423/15 | UD 5508 යතුරුපැදි | 01 |
| 09. | AR 6355/17 | JG 0905 යතුරුපැදි | 01 |
| 10. | AR 584/20 | TH 6126 යතුරුපැදි | 01 |
| 11. | AR 2918 | තණකොළ කපන මැෂින් | 01 |
| 12. | AR 11167 | ජංගම දුරකථන | 02 |
| 13. | AR 11180 | ජංගම දුරකථන | 03 |
| 14. | AR 11163 | ජංගම දුරකථන | 02 |
| 15. | AR 11301 | ජංගම දුරකථන | 02 |
| 16. | AR 11178 B | ජංගම දුරකථන | 01 |
| 17. | PR 82/21 | ජංගම දුරකථන | 04 |
| 18. | AR 11304 | ජංගම දුරකථන | 01 |
| 19. | අංක රහිත | ජංගම දුරකථන | 01 |
| 20. | අංක රහිත | පාපැදි | 01 |
| 21. | අංක රහිත | පාපැදි | 01 |
| 22. | අංක රහිත | පාපැදි | 01 |
| 23. | අංක රහිත | පාපැදි | 01 |
| 24. | අංක රහිත | පාපැදි | 01 |
| 25. | අංක රහිත | පාපැදි | 01 |
| 26. | අංක රහිත | පාපැදි | 01 |
| 27. | අංක රහිත | පාපැදි | 01 |
| 28. | අංක රහිත | පාපැදි | 01 |
| 29. | අංක රහිත | පාපැදි | 01 |
| 30. | අංක රහිත | පාපැදි | 01 |
| 31. | අංක රහිත | පාපැදි | 01 |
| 32. | අංක රහිත | පාපැදි | 01 |
| 33. | අංක රහිත | පාපැදි | 01 |
| 34. | අංක රහිත | පාපැදි | 01 |
| 35. | අංක රහිත | පාපැදි | 01 |
| 36. | අංක රහිත | පාපැදි | 01 |
| 37. | අංක රහිත | පාපැදි | 01 |
| 38. | අංක රහිත | පාපැදි | 01 |
| 39. | අංක රහිත | පාපැදි | 01 |

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|---|
| 40. | අංක රහිත | පාපැදි | 01 |
| 41. | අංක රහිත | පාපැදි | 01 |
| 42. | අංක රහිත | පාපැදි | 01 |
| 43. | අංක රහිත | පාපැදි | 01 |
| 44. | අංක රහිත | පාපැදි | 01 |
| 45. | අංක රහිත | පාපැදි | 01 |
| 46. | අංක රහිත | පාපැදි | 01 |
| 47. | අංක රහිත | පාපැදි | 01 |
| 48. | අංක රහිත | පාපැදි | 01 |
| 49. | අංක රහිත | පාපැදි | 01 |
| 50. | අංක රහිත | පාපැදි | 01 |
| 51. | අංක රහිත | පාපැදි | 01 |
| 52. | අංක රහිත | Shell 12.5 ගෑස් සිලින්ඩර් | 01 |
| 53. | අංක රහිත | Shell 12.5 ගෑස් සිලින්ඩර් | 01 |
| 54. | අංක රහිත | Shell 12.5 ගෑස් සිලින්ඩර් | 01 |
| 55. | අංක රහිත | Shell 12.5 ගෑස් සිලින්ඩර් | 01 |
| 56. | අංක රහිත | Shell 12.5 ගෑස් සිලින්ඩර් | 01 |
| 57. | අංක රහිත | Shell 12.5 ගෑස් සිලින්ඩර් | 01 |
| 58. | අංක රහිත | Shell 12.5 ගෑස් සිලින්ඩර් | 01 |
| 59. | අංක රහිත | Shell 12.5 ගෑස් සිලින්ඩර් | 01 |
| 60. | අංක රහිත | Shell 12.5 ගෑස් සිලින්ඩර් | 01 |
| 61. | අංක රහිත | Shell 12.5 ගෑස් සිලින්ඩර් | 01 |
| 62. | අංක රහිත | Laugfs 12. 5 ගෑස් සිලින්ඩර් | 01 |
| 63. | අංක රහිත | Laugfs 12. 5 ගෑස් සිලින්ඩර් | 01 |
| 64. | අංක රහිත | Laugfs 12. 5 ගෑස් සිලින්ඩර් | 01 |
| 65. | අංක රහිත | Laugfs 12. 5 ගෑස් සිලින්ඩර් | 01 |
| 66. | අංක රහිත | Laugfs 12. 5 ගෑස් සිලින්ඩර් | 01 |
| 67. | අංක රහිත | දගර 4 ගෑස් ලිප | 01 |
| 68. | අංක රහිත | දගර 4 ගෑස් ලිප | 01 |
| 69. | අංක රහිත | දගර 4 ගෑස් ලිප | 01 |
| 70. | අංක රහිත | දගර 4 ගෑස් ලිප | 01 |
| 71. | අංක රහිත | දගර 4 ගෑස් ලිප | 01 |
| 72. | අංක රහිත | දගර 3 ගෑස් ලිප | 01 |
| 73. | අංක රහිත | දගර 3 ගෑස් ලිප | 01 |
| 74. | අංක රහිත | දගර 3 ගෑස් ලිප | 01 |
| 75. | අංක රහිත | දගර 3 ගෑස් ලිප | 01 |
| 76. | අංක රහිත | දගර 3 ගෑස් ලිප | 01 |
| 77. | අංක රහිත | දගර 3 ගෑස් ලිප | 01 |
| 78. | අංක රහිත | දගර 3 ගෑස් ලිප | 01 |
| 79. | අංක රහිත | දගර 3 ගෑස් ලිප | 01 |
| 80. | අංක රහිත | දගර 3 ගෑස් ලිප | 01 |
| 81. | අංක රහිත | දගර 3 ගෑස් ලිප | 01 |

09-344

## මුතූර් දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය

### ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම - 2022.10.15

01. මුතූර් දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද හිමිකම් නොකියන ලද පහත සඳහන් නඩු භාණ්ඩ **2022.10.15 වැනි දින පෙ. ව. 9.00** ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට කලින් වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි වේ.

03. අධිකරණය විසින් නියම කරනු ලබන ලංසුව නොපිළිගැනෙන අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතු වේ.

04. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ ඒ අවස්ථාවේ දී මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර සියලුම ගෙවීම් මුදල්වලින් පමණක් කළ යුතු ය.

05. වෙන්දේසියෙන් භාණ්ඩ මිලදී ගැනීමට පැමිණෙන්නන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර අනන්‍යතාවය තහවුරු කළ යුතු ය.

එච්. එම්. තස්නීම් ෆවුසාන්,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
මුතූර්.

### මුතූර් දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට නියමිත නඩු භාණ්ඩ - 2022.10.15

| | | | |
|---|---|---|---|
| 1. | වැලි | | 45 ඝනකයක් |
| 2. | බොරළු | | 06 ඝනකයක් |
| 3. | සවල් | | 200 |
| 4. | ලොකු යකඩ බාල්දි (හිල් සහිත) | | 30 |
| 5. | පොඩි යකඩ බාල්දි (හිස් සහිත) | | 20 |
| 6. | පොඩි ඇලුමිනියම් හට්ටි | | 05 |
| 7. | ලොකු ඇලුමිනියම් හට්ටි | | 04 |
| 8. | ලොකු යකඩ කිඩාරම් | | 02 |
| 9. | ලොකු යකඩ තාච්චි | | 05 |
| 10. | පොඩි යකඩ තාච්චි | | 05 |
| 11. | පොරව | | 15 |
| 12. | ප්ලාස්ටික් කළ | | 03 |
| 13. | උදල්ල | | 15 |
| 14. | හිස් බැරල් | | 12 |
| 15. | පිහි | | 15 |
| 16. | කුඩා ප්‍රමාණයේ දැව | | $4m^3$ |
| 17. | AR 380/21 | | |
| | ඔක්සිජන් සිලින්ඩර හා උපකරණ | | 03 |
| 18. | MC 48365/21 | | |
| | බුරුත ඇදන් | | |
| | | A 6 x 5 | |
| | | B 6 x 5 | 04 |
| | | C 6 x 5 | |
| | | D 6 x 4 | |
| | MC 47515/20 | | 02 |
| | බුරුත ඇඳන් | 1.8 m x 1.5 m | |

09-357

## අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

භාවිතයෙන් ඉවත් කරන ලද අබලි භාණ්ඩ වෙන්දේසි කිරීම

මෙම කොමිෂන් සභාවේ භාවිතයෙන් ඉවත් කරන ලද අබලි භාණ්ඩ **2022.10.14 වැනි දින පෙ. ව. 10.00 ට** වෙන්දේසිකර විකුණනු ලැබේ.

2021.12.31 දිනට පවත්වනු ලැබූ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව ප්‍රයෝජනයට ගත නොහැකි අබලි භාණ්ඩ ලේඛනය (පොදු 47)

| අංකය | භාණ්ඩය | ප්‍රමාණය |
|---|---|---|
| 1. | විල්බැරෝව | 01 |
| 2. | LED බල්බ් | 50 |
| 3. | උදලු | 01 |
| 4. | කියත් ගාන පීරි | 01 |
| 5. | Scanner | 01 |
| 6. | Unmanaged POE Hikvision (ලොකු) | 01 |
| 7. | Unmanaged POE Hikvision (පොඩි) | 01 |
| 8. | HETGEAR (ලොකු) | 01 |
| 9. | Water Filter | 01 |
| 10. | පරණ ටයර් ටියුබ් | තොගය |
| 11. | පංචර් - සිදුරු 01 | 04 |
| 12. | පංචර් - සිදුරු 02 | 05 |
| 13. | පත්තර | තොගය |
| 14. | පරිගනක පුටු | 05 |
| 15. | විධායක පුටු | 05 |
| 16. | ලිපිකරු පුටු | 03 |
| 17. | ටයර් | 48 |
| 18. | අබලි කාපට් (අළු, රතු) | තොගය |
| 19. | දොරවල් | 02 |
| 20. | යකඩ බට | 08 |
| 21. | යකඩ බංකු කැලි | 03 |
| 22. | ගලවා ඉවත් කරන ලද ලී පරාල | තොගය |
| 23. | ඡායා පිටපත් යන්ත්‍ර | 02 |
| 24. | ප්ලාස්ටික් පිඟන්/කෝප්ප | 05/02 |
| 25. | ලැප්ටොප් චාජර් | 24 |
| 26. | ලැප්ටොප් බැටරි | 14 |
| 27. | ෆින්ගර් ප්‍රින්ට් බැටරි | 02 |
| 28. | ගණක යන්ත්‍ර | 11 |
| 29. | Mouse | 03 |
| 30. | කතුරු | 02 |
| 31. | කටු ඇමුණුම් යන්ත්‍ර | 12 |
| 32. | Intercom දුරකථන | 03 |
| 33. | UPS | 06 |
| 34. | AC Unit | 01 |
| 35. | බැටරි (වාහන) | 08 |
| 36. | වාහන අමතර කොටස් | තොගය |
| 37. | උලුවස්ස (ලොකු) | 01 |
| 38. | උලුවස්ස (පොඩි) | 01 |
| 39. | ඇස්බැස්ටෝස් තහඩු | 12 |
| 40. | MDF මේස ලෑල්ල | 01 |
| 41. | පාටිෂන් බාර් | තොගය |
| 42. | ඇඳි සහිත ලී පුටු | 04 |
| 43. | ලිපි බන්දේසි | 02 |
| 44. | මුද්‍රණ යන්ත්‍ර | 02 |
| 45. | Key Board | 03 |
| 46. | ලී මේස | 01 |
| 47. | සිවිලින් ෆෑන් | 03 |
| 48. | කැබිනට් (ලාච්චු 04) | 01 |
| 49. | විදුලි පන්දම් | 05 |
| 50. | යකඩ පුටු | 01 |
| 51. | ප්ලාස්ටික් පුටු | 01 |
| 52. | අමුත්තන් සඳහා පුටු | 02 |
| 53. | බහුකාර්ය විදුලි දිගු | 05 |
| 54. | පරිගණක | 01 |
| 55. | විදුලි පංකා (Box) | 01 |
| 56. | CDMA දුරකථන | 01 |
| 57. | ලාච්චු | 02 |
| 58. | ඔරලෝසු (මේස) | 02 |
| 59. | ජංගම දුරකථන Samsung Glaxy grand 02, EMI - 35212303646321 | 01 |
| 60. | Presentors | 01 |
| 61. | රූපවාහිනි යන්ත්‍ර | 01 |
| 62. | විදුලි ස්ත්‍රික්ක | 01 |

මෙම භාණ්ඩ එදින පෙ. ව. 9.00 සිට 9.45 දක්වා කාලය තුළ පරීක්ෂා කළ හැකි අතර පෙ. ව. 10.00 ට වෙන්දේසි කටයුතු ආරම්භ වේ.

ගැණුම්කරුවන් විසින් මුදලින් වටිනාකම ගෙවා තමන් මිල දී ගත් සියලුම භාණ්ඩ එදින ප. ව. 3.30 ට පෙර මෙම කාර්යාල පරිශ්‍රයෙන් ඉවත් කර ගත යුතු ය.

ඩබ්ලිව්. කේ. විජේරත්න,
අධ්‍යක්ෂ ජනරාල්.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව,
අංක 36, මලලසේකර මාවත,
කොළඹ 07.
2022 සැප්තැම්බර් මස 21 වැනි දින.

09-370

## මහනුවර මහෙස්ත්‍රාත් අධිකරණය

### ප්‍රසිද්ධ වෙන්දේසිය පිළිබඳ නිවේදනය

මහනුවර මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද නඩු භාණ්ඩ වන වාහන 14ක් අමතර කොටස් තොගයක් හා පා පැදි 02ක් **2022 ඔක්තෝබර් මස 15 වැනි දින පෙ. ව. 9.30** ට මෙම අධිකරණ පරිශ්‍රයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙහි සඳහන් වන කිසියම් වාහනයක් සම්බන්ධයෙන් හිමිකම් දැක්වීමට අපේක්ෂා කරන තැනැත්තන් වෙන්දේසිය පැවැත්වෙන දින පෙ. ව. 9.30 ට පෙර ස්වකීය හිමිකම තහවුරු කිරීමට අදාල සාධක රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

02. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත වෙන්දේසිය පැවැත්වෙන දින පෙ. ව. 8.00 සිට පෙ. ව. 9.00 දක්වා වෙන්දේසියේ විකිණීමට නියමිත වාහන හා අනෙකුත් භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැක.

03. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගන්නා අවස්ථාවක දී අධිකරණයේ අභිමතය පරිදි එම අයිතමයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ බලය අධිකරණය සතු වේ.

04 වෙන්දේසියෙන් ලබා ගන්නා සියලුම වාහන සඳහා ගෙවීම් එම අවස්ථාවේ දී ම ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් ගෙවා එදින ප. ව. 3.00 ට පෙර භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

05. වාහන මිලදී ගන්නා සෑම තැනැත්තෙකුම ස්වකීය ජාතික හැඳුනුම්පත, වලංගු රියදුරු බලපත්‍රය, වලංගු විදේශ ගමන් බලපත්‍රය ඉදිරිපත් කර අනන්‍යතාවය තහවුරු කළ යුතු ය.

ශ්‍රීනිත් විජේසේකර,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
මහනුවර.

2022 අගෝස්තු මස 23 වැනි දින,
මහනුවර මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**2022.10.15 දිනට මහනුවර මහෙස්ත්‍රාත් අධිකරණයේ වෙන්දේසි කිරීමට නියමිත වාහන හා භාණ්ඩ ලැයිස්තුව**

| *අනු. අංකය* | *නඩු අංකය* | *වාහන අංකය* | *වාහන වර්ගය* | *විස්තරය* |
|---|---|---|---|---|
| 01. | 11768/16 | 34 ශ්‍රී 4140 | ලොරි රථය | ලියාපදිංචි කළ නොහැක. අමතර කොටස් සඳහා පමණි. |
| 02. | 12341/16 | 28 ශ්‍රී 4307 | ලොරි රථය | |
| 03. | 14711/16 | 34 ශ්‍රී 9250 | ලොරි රථය | |
| 04. | AR 42411/17 | අංක රහිත | යතුරු පැදිය | |
| 05. | B 305/15 | CP VH - 9572 | යතුරු පැදිය | |
| 06. | B 13991 | CP HD 4664 | යතුරු පැදිය | |
| 07. | B 37365/16 | CP VI 5664 | යතුරු පැදිය | |
| 08. | 85659 | 132 - 1244 | යතුරු පැදිය | |
| 09. | 13193/16 | 47 - 2392 | ලොරි රථය | ලියාපදිංචි කළ හැක. |
| 10. | 41111/20 | 48 - 4563 | ලොරි රථය | |
| 11. | 55824/22 | CP XL 1553 | යතුරු පැදිය | |
| 12. | 11031/18 | අංක රහිත | යතුරු පැදිය | |
| 13. | 53692/21 | WP XX 3414 | යතුරු පැදිය | |
| 14. | 47604 | NW HG 9992 | යතුරු පැදිය | |

| *අනු. අංකය* | *නඩු අංකය* | *වාහන අංකය* | *වාහන වර්ගය* | *විස්තරය* |
|---|---|---|---|---|
| 15. | 68541/13 | අමතර කොටස් | 01. හයිජෙට් වර්ගයේ වෑන් රථ පාර්කින් ලයිට් 02යි<br>02. සුභාරු වෑන් රථ ටේල් ලයිට් 02යි<br>03. සුසුකි ට්‍රක් රථ ටේල් ලයිට් 02යි<br>04. මිට්සුබිෂි රථ ටේල් ලයිට් 02යි<br>05. මිට්සුබිෂි වෑන් රථ ටේල් ලයිට් 01යි<br>06. සුසුකි ට්‍රක් රථ ටේල් ලයිට් 03යි<br>07. හයිජෙට් වර්ගයේ වෑන් රථ ටේල් ලයිට් 01යි<br>08. හයිජෙට් වර්ගයේ ට්‍රක් රථ ටේල් ලයිට් 01යි | |
| 16. | 31449/19 | YD 20800685 | පා පැදිය | |
| 17. | 66322/12 | අංක රහිත | පා පැදිය. | |

09-343

---

# රජයේ නොවන දැන්වීම්

## රන් මලු පැෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගමේ ලියාපදිංචි අංකය පීවී 2258

*ඇවරකරුවෙකු මුදා හැරීමේ නොතිසිය*

හවුල් ඇවරකරුවෙකු ලෙස ඒකාබද්ධව කටයුතු කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතට සහ 1939

ගණන් බේරා වසා දැමීමේ නීතිරීතිවල 162 (2) රීතියට යටත්ව

| | | |
|---|---|---|
| සමාගමේ නම | : | රන් මලු පැෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය | : | අංක 03, බුලර්ස් පටුමග, කොළඹ 07 |
| උසාවිය | : | බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය (කොළඹ සිවිල්) |
| නඩු අංකය | : | HC (සිවිල්) 50/2011/CO |
| හවුල් ඇවරකරුවන්ගේ නම් | : | පී. ඊ. ඒ. ජයවික්‍රම සහ ජී. ජේ. ඩේවිඩ් |
| ලිපිනය | : | 4 වන මහල, අංක 02, (දැනට 3 වන මහල, අංක 11) කාසල් පටුමග, කොළඹ 04 |
| මුදාහරින ලද ඇවරකරුවන්ගේ නම | : | පී. ඊ. ඒ. ජයවික්‍රම |
| ඇවරකරු මුදා හරින ලද දිනය | : | 2022.08.24<br>මෙහි පහත අත්සන් කර ඇති මා විසින් මෙයින් දැනුම් දෙනු ලබන්නේ (අනික් අයට ධූරයේ දිගටම කටයුතු කිරීමට අගතියක් නොවන පරිදි) ඉහත සඳහන් සමාගමේ හවුල් ඇවරකාර ධූරයෙන් මාගේ මුදා හැරීම අධිකරණය විසින් පිළිගෙන අනුමත කරන ලදී. |
| ධූරයේ ඉතිරිව සිටින ඇවරකරුගේ නම | : | ජී. ජේ. ඩේවිඩ් විසින් ඉහත සමාගමේ ඇවරකරු වශයෙන් තවදුරටත් කටයුතු කරනු ලැබේ. |

පී. ඊ. ඒ. ජයවික්‍රම,
ඇවරකරු.

2022 සැප්තැම්බර් මස 14 වැනි දින.

09-355

## විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ 06, කිරුළපොන, ගජබා පෙදෙස, අංක 02 දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 742890104 V හිමි බ්‍රයන් ප්‍රින්සෝ වෝල්ටර් වන මම කොළඹ නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් මීරාසාහිබ් මහරුෆ් ලියා සහතික කළ අංක 72 හා වර්ෂ 2019 ජුනි 17 දිනැති විශේෂ ඇටර්නි බලපත්‍රයෙහි රාජගිරිය, ඔබේසේකරපුර, ක්‍රීඩාපිටිය පාර, අංක 221 දරන ස්ථානයේ පදිංචි අංක 867453296 V දරන ජාතික හැඳුනුම්පත හිමි ෂිෆානි ෆාතිමා මහරූෆ් මහත්මියට දී ඇති ඇටර්නි බලය වහාම ක්‍රියාත්මක වන පරිදි අවලංගු කර ඇති බව ද, මින් පසු එකී ඇටර්නි බලපත්‍රය යටතේ ඇය විසින් කරනු ලබන කිසිම කටයුත්තකට මා විසින් වග නොකියන බව මහජනතාව වෙත දන්වා සිටිමි.

බ්‍රයන් ප්‍රින්සෝ වෝල්ටර්.

2022 සැප්තැම්බර් මස 09 වැනි දින.

09-341

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2020 දෙසැම්බර් මස 05 වැනි දින සංස්ථාගත කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : එම්පයර් ඇල්ෆා (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පීවී 00239343
ලියාපදිංචි ලිපිනය : අංක 37 4/6, මවුන්ට් බ්‍රීස් එපාර්ට්මන්ට්, ටෙම්ප්ලර්ස් පාර, ගල්කිස්ස, රත්මලාන.

අධ්‍යක්ෂක මණ්ඩලය අණ පරිදි,

ග්‍රෙගරීස් පාර්ට්නර්ස්,
සමාගම් ලේකම්.

53/3, ග්‍රෙගරීස් පාර,
කොළඹ 07.

09-352

---

## පවරන ලද ඇටර්නි බලය අහෝසි කිරීම

පොදු ජනතාව වෙත කරුණාවෙන් අවධාරණය කරන වග නම්, කොටහේන, ශ්‍රී ගුනානන්ද මාවතේ, අංක 115/26 B දරන ලිපිනයෙහි පදිංචි කනකරත්න මුදියන්සේලාගේ ශිරානි සිල්වා වන මා විසින් 2012.08.08 දින කමනි එස්. කාසිවෙච්චි ප්‍රසිද්ධ නොතාරිස් සහතික කළ අංක 3281 දරන ඇටර්නි බලපත්‍රය මගින් කොටහේන, සුමිත්‍රාරාම මාවත, අංක 97/12 දරන ලිපිනයෙහි පදිංචි අල්ගවත්තගේ සුමිත්‍රාවතී වෙත පවරන ලද සියලු නීතිමය බලය අහෝසිකර, බල රහිත කර තිබෙන බවත්, මින් මතුවට මෙහි සඳහන් නීතිමය බලය අහෝසියට ලක් වූ පුද්ගලයා සිදු කරන කිසිදු ගණුදෙනුවකට ක්‍රියාවකට හෝ වාචිකයකට මම වග නොකියන බවත් ය.

කනකරත්න මුදියන්සේලාගේ ශිරානි සිල්වා.

09-358

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව පහත සමාගම් වල නාමයන් පහත පරිදි වෙනස් කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පැවති නම : සිලෝන් ඩ්‍රීම්ස් හොටෙල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
වෙනස් කළ පසු නාමය : සිලෝන් හයි එඩියුකේෂන් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පීවී 00211856
ලියාපදිංචි කාර්යාලය : අංක 9/1/1 නිකොලස් මාර්කස් පාර, මීගමුව
දිනය : 2022.09.06

(ඉහත සඳහන් සමාගමෙහි ලේකම්)

09-365

---

## විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නුගේගොඩ, ගංගොඩවිල, උද්‍යාන මාවත අංක 31 හි පදිංචි ගමාච්චි විතානගේ මහින්ද පෙරේරා (ජාතික හැඳුනුම්පත් අංක 432770710 V) වන මම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ලලනි හෙට්ටිගේ විසින් සහතික කරන ලද අංක 4140 සහ 2021.03.19 දින දරන විශේෂ ඇටර්නි බලපත්‍රය මගින් පන්නිපිටිය, මහල්වරාව පාර, අංක 72/5ඒ හි පදිංචිව සිටින සජීව රන්ජන් පොල්වත්ත (ජාතික හැඳුනුම්පත් අංක 671840356 V) යන අය වෙත පවරන ලද විශේෂ ඇටර්නි බලය 2022.09.16 දින පටන් අවලංගු කර නිෂ්ප්‍රභා කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ගමාච්චි විතානගේ මහින්ද පෙරේරා.

09-368

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

කැනඩාවේ, වෙන්කෝව බීසී, කින්ස් වේ අංක 944, වී V වී 3 සී 4 ඒපී 3 හි පදිංචි මල්ලිකා අප්පුහාමිලාගේ නෙවිල් ආනන්දසිරි මන්ත්‍රීරත්න වන මා විසින් රදාවාන, මන්ඩාවල පාර අංක 345 හි පදිංචි එදිරිසූරිය මුදියන්සේලාගේ සෝභාත් බුද්ධික එදිරිසූරිය යන අයට බලය පවරමින් වැන්තුවර් හි ප්‍රසිද්ධ නොතාරිස් ආශා ලෙහිආ විසින් වර්ෂ 2019.05.30 දින සහතික කරන ලද ගම්පහ අතිරේක සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ දිනපොත් අංක 2042 හි 11 පිටුවේ ලියාපදිංචි කර ඇති ඇටර්නි බලපත්‍රය අද දින සිට අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

මල්ලිකා අප්පුහාමිලාගේ නෙවිල් ආනන්දසිරි මන්ත්‍රීරත්න.

2022.09.22

09-393

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකාවේ යාපනය දකුණු කයිතඩි සහ දැනට Chemim Dee Pontets, 071212 Grand - Lancy Switzerland ලිපිනයේ පදිංචි සුන්දරලිංගම් රුබලිංගම් (විදේශ ගමන් බලපත්‍ර N 7338050) සහ සුන්දරලිංගම් මිතුනා (විදේශ ගමන් බලපත්‍ර එන් 826660) වන අප 2021/3/2 වැනි දින Geneve - Switzerland හි පදිංචි කේ. චන්ද්‍රමෝහන් ප්‍රසිද්ධ නොතාරිස් තැන ලියා සහතික කළ ඇටර්නි බලපත්‍රය මගින් යාපනය දිස්ත්‍රික්කයේ, යාපනය, දකුණු කයිතඩි හි පදිංචි කන්දයියා කන්දසාමි (ජාතික හැඳුනුම්පත් අංක 195808805012) යන අයට ප්‍රදානය කළ ඇටර්නි බලය (යාපනයේ රෙජිස්ට්‍රාර් ජනරාල් උතුරු කලාපය Vol. 134 folio No. 95 D. B. No. 570 දින 16/3/2021 P. O. A. රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර ඇත) 2022.07.17 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කළ බව මෙයින් ප්‍රකාශ කර සිටිමි. අනාගතයේ දී ඔහු විසින් සිදු කරනු ලබන කිසිදු ක්‍රියාවකට අප වගකියනු නොලබන බව මෙයින් ප්‍රකාශ කර සිටිමු.

සුන්දරලිංගම් රුබලිංගම් සහ සුන්දරලිංගම් මිතුනා.

09-394

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

පොල්ගහවෙල, කෑගල්ල පාර, අංක 257/29 දරන ස්ථානයේ පදිංචි මොහොමඩ් තව්ෆික් මොහොමඩ් මුසාෆර් (ජා. හැ. අංක 19693600171 සහ ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍ර අංක N 8538140) වන මා විසින් මාගේ ඇටර්නි බලකරු ලෙස කලගෙඩිහේන, තිහාරිය, නුවර පාර, අංක 142/3 දරන ස්ථානයේ පදිංචි මොහොමඩ් තව්ෆික් මොහොමඩ් රිස්වාන් (ජා. හැ. අංක 742591131 V) යන අය 2021 ජූලි මස 06 වැනි දින මා විසින් අත්සන් කරන ලද විදේශීය විශේෂ ඇටර්නි බලපත්‍රය මගින් පත් කරන ලදී. එකී ඉහත දින දරන ඇටර්නි බලපත්‍රය අවලංගු කරන බව මෙයින් සියලු දෙනා වෙත දන්වා සිටිමි.

මොහොමඩ් තව්ෆික් මොහොමඩ් මුසාෆර්,

2022 සැප්තැම්බර් මස 08 වැනි දින,
අංක 257/29, කෑගල්ල පාර, පොල්ගහවෙල.

09-395

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

මොරටුව, කොරළවැල්ල, ගුණවර්ධනාරාම පාර, අංක 3 ''සදකැලුම්'' දරන ස්ථානයේ පදිංචි වර්ණකුලසූරිය වඩුමෙස්ත්‍රිගේ චමින්ත ධමේන්ද්‍ර මෙන්ඩිස් වන මම මා විසින් මොරටුව කොරළවැල්ල ගුණවර්ධනාරාම පාර අංක 3 ''සදකැලුම්'' දරන ස්ථානයේ පදිංචි වර්ණකුලසූරිය වඩුමෙස්ත්‍රිගේ සුගතපාල මෙන්ඩිස් යන අය මාගේ ඇටර්නි බලකරු වශයෙන් පත් කරන ලද ප්‍රසිද්ධ නොතාරිස් කොට්ටාව සිංගක්කාරගේ චනිෂ්ක ප්‍රසාද් කාරියවසම් ප්‍රනාන්දු විසින් ලියා සහතික කරන ලද අංක 80 සහ වර්ෂ 2017.04.12 දින දරන ඇටර්නි බලපත්‍රය අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කර අහෝසි කළ බව මෙයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් දැනුම් දෙමි. මින් මතු එකී ඇටර්නි බලපත්‍රය මත එකී ඇටර්නි බලකරු විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවක් හෝ ගනුදෙනුවකට මම කිසිදු වගකීමක් නොදරන බව මෙයින් දැනුම් දෙමි.

ඩබ්. ඩබ්. සී. ධමේන්ද්‍ර මෙන්ඩිස්.

09-406

---

## ඇටර්නි බලය අවලංගු කිරීම

මන්නාරම මුවර් (යෝනක) පාරේ පදිංචි ජා. හැ. ප. අංක 443410198 V හිමි හජාමොහිඩීන් මොහමඩ් නිසාම් වන මා විසින් කොළඹ 10 ශ්‍රී වජිරඥාණ මාවතේ, අංක 141/16 -2/1 හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 661651725 V හිමි රාසික් මොහමඩ් ක්වාතීර් ඛාන් යන අය හට ප්‍රදානය කරන ලද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එම්. මොහිඩීන් විසින් ලියා සහතික කරන ලද අංක 529 හා 2020.07.02 දාතම දරන ඇටර්නි බලපත්‍රය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කර අහෝසි කර අවලංගු කරන ලද බව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් පොදු මහජනතාවටත් දන්වා සිටිමි. තවද, ඉහත කී මාගේ ඇටර්නි බලකරු විසින් මා වෙනුවෙන් සිදු කරනු ලබන කවර හෝ ක්‍රියාවකට හෝ එළඹනු ලබන කවර හෝ ගනුදෙනුවකට ගිවිසුමකට මෙතැන් සිට මා කිසිදු වගකීමක් නොදරනු ලබන බව ද මෙයින් දැනුම් දෙමි.

හජාමොහිඩීන් මොහමඩ් නිසාම්.

09-414

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 5 වගන්තිය ප්‍රකාරව දැන්වීමයි

සමාගමේ නාමය : රැඩැක් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලය : 244/1/එස්. සුහද මාවත, ධර්මදර්ශී පාර, ඉහල කරගහමුන, කඩවත, මහර.
ලියාපදිංචි අංකය : පීවී 00263302
සංස්ථාපනය කළ දිනය : 2022 සැප්තැම්බර් මස 15 වැනි දින.

සමාගම් ලේකම්.

09-415

## ඇටර්නි බලකරය අවලංගු කිරීම

පිළියන්දල, හොන්නන්තර දකුණ, ස්වර්ණ පෙදෙස, අංක 36/13 හි පදිංචි වීරහැන්දිගේ ශ්‍රියානි පුෂ්පලතා වන මම ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. උපාලි ඒ. රත්නායක මහතා විසින් ලියා සහතික කළ අංක 77 හා වර්ෂ 2022 ජුනි මස 24 දිනැති ඇටර්නි බලකරය මගින් මාගේ ඇටර්නි බලකරු වශයෙන් කුරුණෑගල, දඹුල්ල පාර, සමන්පුර අංක 41 පදිංචි ලලිත් උදේනි පද්මසිරි ජයවීර යන අය පත් කළ අතර, අද පටන් එය අවලංගු කර ඇති බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

වීරහැන්දිගේ ශ්‍රියානි පුෂ්පලතා.

09-422

---

## ඇටර්නි බලය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

කොළඹ 15, මෝදර වීදියේ, අංක 55 හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 488173456 V දරන රානි ඩෙල්මා ජෙයන්ද්‍රරාජා වන මා විසින් කොළඹ 15, මට්ටක්කුළිය කාක දූපතේ අංක බී 26/4 හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 557822372 V හිමි රීනි හෙප්ශිබා සෙල්වරාජ් වෙත ප්‍රදානය කරන ලද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එල්. අනුරුද්ධ ලියනගේ විසින් ලියා සහතික කරන ලද දෙල්කඳ, රෙජිස්ට්‍රාර් ජනරාල් කලාප කාර්යාලයේ දිනපොත් අංක 6655 හි 81 වන පත්ඉරුවේ බලපත්‍ර පොතේ 191 වන වගන්තිය/කොටස යටතේ 2016 නොවැම්බර් මස 09 වන දින ලියාපදිංචි කරන ලද අංක 624 හා 2016 නොවැම්බර් මස 4 වැනි දින දාතම දරන ඇටර්නි බලපත්‍රය වහාම ක්‍රියාත්මක වන පරිදි අහෝසි කර, අවලංගු කර, ප්‍රත්‍යාදිෂ්ඨ කර, බල ශූන්‍ය කරන ලද බැව් මෙයින් දැනුම් දෙමි. එකී ඇටර්නි බලකරු වන ඇය විසින් මා වෙනුවෙන් එළඹෙනු ලබන කවර හෝ ගනුදෙනුවකට, කරනු ලබන ක්‍රියාවකට බලයකට, දෙයකට හෝ කරුණු කාරණාවකට මෙතැන් පටන් මා කිසිදු වගකීමක් හෝ වගවීමක් නොදරනු ලබන බව ද මෙයින් දැනුම් දෙමි.

ආර්. ඩී. ජෙයන්ද්‍රරාජා.

09-410

---

## ඇටර්නි බලය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

මන්නාරම එලුතූර් හි අංක 19 හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 395920731V දරන මේරි ලිලි ජීවරත්නම් නොහොත් සීවරත්නම් වන මා විසින් යාපනය, රාසවින් තෝඩ්ඩම් හි අංක 34/2 හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 715152878 V හිමි ඩොරිස් බොනිටා නරේන්ද්‍රනාදන් මහත්මිය වෙත ප්‍රදානය කරන ලද යාපනය ප්‍රසිද්ධ නොතාරිස් එස්. පුන්නියාමූර්ති විසින් ලියා සහතික කරන ලද කොළඹ 11, (දැන් බත්තරමුල්ල) හි ප්‍රධාන රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ දින පොත් අංක 8429 හි 52 වන පත්ඉරුවේ බලපොත් අංක 280 වගන්තිය කොටස යටතේ 2004 ජූලි මස 5 වැනි දින ලියාපදිංචි කරන ලද අංක 4122 හා 2004 පෙබරවාරි මස 19 වැනි දාතම දරන ඇටර්නි බලපත්‍රය වහාම ක්‍රියාත්මක වන පරිදි ප්‍රත්‍යාදිෂ්ඨ කර, අවලංගු කර, අහෝසි කර, බලශූන්‍ය කරන ද බැව් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් පොදු මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි. එකී මාගේ ඇටර්නි බලකරු විසින් මා වෙනුවෙන් කරනු ලබන ක්‍රියාවකට, බලයකට, කරුණකට හෝ දෙයකට, එළඹෙනු ලබන ගනුදෙනුවකට මෙතැන් සිට මා කිසිදු වගකීමක් හෝ වගවීමක් නොදරනු ඇති බැව් ද දැනුම් දෙමි.

එම්. එල්. ජීවරත්නම්.

09-411

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

සෙන්කඩ එක්ස්පෝට්.
ගිණුම් අංක : 0072 1000 2396.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.10.31 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් පනස් තුන් ලක්ෂ හැත්තෑ එක් දහස් එකසිය අනූ පහයි ශත පනහක (රු. 5,371,195.50) මුදලද, 2019 ඔක්තෝබර් මස 16 වැනි දින සිට අංක 3998 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පනස් ලක්ෂයක (රු. 5,000,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.12.27 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2020.12.11 වැනි දින ''දිවයින'' සහ ''තිනක්කුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි

**2022.10.21 වැනි දින පෙ. ව. 11.30 ට** පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බලපිටිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, වතුගෙදර - දකුණ අංක 87A දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ, වතුගෙදර පිහිටි "කම්මලවත්ත හි ලොට් 12හි ලොට් 12A නොහොත් මහගෙදර වත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. ඒ. ආර්. චන්ද්‍රසිරි යන අය විසින් සාදන ලද 2018 සැප්තැම්බර් මස 06 දාතම හා අංක 3774 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 12A වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ ලොට් 13 (බලපිටිය දිස්ත්‍රික් උසාවියේ නඩු අංක 36158 හි සඳහන් වාස් ද එස්. ගිනිගේ හි 816 දරන පිඹුරේ නිරූපිත), නැගෙනහිරට : විවේකාරාමය පාර, දකුණට : තෙනුවර වෙසෙන්ති පදිංචිව උන් ගොඩඋඩවත්ත සහ බස්නාහිරට : ගොඩඋඩවත්ත සහ මෙම ඉඩමේ ලොට් 12C යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි හතරයි දශම නමයක් (පර්. 24.9) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී අංක 3774 දරන පිඹුරට අනුව ය.

එකී ලොට් 12A පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බලපිටිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, වතුගෙදර - දකුණ අංක 87A දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ, වතුගෙදර පිහිටි ලොට් 12 වශයෙන් සීමා නිර්ණය කොට ඇති උපබෙදුම කම්මලවත්ත නොහොත් මහගෙදර වත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඊ. ගාල්ලගේ යන අය විසින් සාදන ලද 1974 ජූලි 05 දාතම හා අංක 784 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 12A වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ ලොට් 13, නැගෙනහිරට : පාර, දකුණට : තෙනුවර විජෙන්ති පදිංචිව උන් ගොඩඋඩවත්ත සහ බස්නාහිරට : ගොඩඋඩවත්ත සහ මෙම ඉඩමේ ලොට් 12C යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි හතරයි දශම නමයක් (පර්. 24.9) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී අංක 3774 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව D 156/57 යටතේ බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

සමාගම් ලේකම්,

09-418

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ටී. සිවසිදම්බරම්, ජේ. දුලේන්ද්‍ර සහ කේ. මනෝන්මන්නි,
ගිණුම් අංක : 1109 5765 8907.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ

ලැබී ඇති බලතල ප්‍රකාර 2020.10.29 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක් කෝටි අසූ පන් ලක්ෂ තිස් තුන් දහස් හාරසිය දහසයයි ශත විසි තුනක (රු. 18,533,416.23) මුදලද, 2020 සැප්තැම්බර් මස 16 වැනි දින සිට අංක 1517 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක් කෝටි හැට එක් ලක්ෂ හැට හතර දහස් දෙසිය හැත්තෑ හයයි ශත හැට හතක (රු. 16,164,276.67) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම දෙකයි පහක් (16.25%) බැගින් වූ පොලිය ද, දන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2021.01.01 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2020.12.17 වැනි දින ''දිවයින'' සහ ''තිනක්කුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි **2022.10.26 වැනි දින පෙ. ව. 11.30 ට** පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩ විල්ලි හත්පත්තුවේ, ගන්දහයෙ කෝරලේ මාවතගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, මාවතගම (උතුර) අංක 678, ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මාවතගම ග්‍රාමයේ පිහිටි "සීෆීල්ඩ් එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. එම්. තිලකරත්න බණ්ඩා විසින් සාදන ලද 2017 ජුනි මස 09 දතම හා අංක 2017/132 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙද වෙන් කොට ලොට් 01 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : තිස්ස මුදලාලි විසින් හිමිකම් කියන ඉඩම සහ ඇළ, නැගෙනහිරට : ඇළ සහ තුරෙයිරාජා සිවසිදම්බරම් විසින් හිමිකම් කියන ඉඩම, දකුණට : තුරෙයිරාජා සිවසිදම්බරම් විසින් හිමිකම් කියන ඉඩම සහ කඳගොල්ල සිට කුරුණෑගල - මහනුවර ප්‍රධාන පාර දක්වා පාර (ප්‍රා ස), බස්නාහිරට: කඳගොල්ල සිට කුරුණෑගල - මහනුවර ප්‍රධාන පාර දක්වා පාර (ප්‍රා ස) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිහක් (පර් : 30) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග අංක 2017/132 දරන එකී පිඹුරට අනුවය.

එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමක් වේ :-

එකී මාවතගම ග්‍රාමයේ පිහිටි "සීෆීල්ඩ් එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. කේ. කනගසබෙයි විසින් සාදන ලද 1994 අප්‍රේල් මස 06 දින හා අංක 386 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 01 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : තිස්ස මුදලාලි විසින් හිමිකම් කියන ඉඩම සහ ඇළ, නැගෙනහිරට : ඒ. කාසිඅම්මා විසින් හිමිකම් කියන ගල්වලකුඹුර වෙන්කෙරෙන ඇළ, දකුණට : තුරෙයිරාජා සිවසිදම්බරම් විසින් හිමිකම් කියන ඉඩම, බස්නාහිරට සහ නිරතට : කඳගොල්ල සිට මාවතගම දක්වා පාර (ගම් සභා) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිහක් (පර්. 30) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග අංක 386 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව A 1270/59 යටතේ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

09-419

---

## හැටන් නැෂනල් බැංකුව පීඑල්සී - ප්‍රධාන කාර්යාල ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසියයි

හොකන්දර, තලවතුගොඩ පාරේ වරිපනම් අංක 23/65 සහ 23/65ඒ දරන පරිශ්‍රයන් තුළ පිහිටි පිළිවෙළින් පර්චස් 10.15 සහ පර්චස් 9.55 විශාලැති අගනා පරිශ්‍රයන්.

බස්නාහිර පළාතේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සහ කඩුවෙල මහනගර සභා සීමාවේ බත්තරමුල්ල ඒකකය තුළ වික්‍රමසිංහපුර (අංක 479 සී) ග්‍රාම නිලධාරි වසම තුළ වරිපනම් අංක 23/65 සහ 23/65 ඒ තලවතුගොඩ හොකන්දර පාර තලංගම දකුණ පිහිටි ''වැවකැලේ'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. එල්. එන්. පෙරේරා විසින් සාදන ලද අංක 4289 හා 2007 ඔක්තෝබර් මස 1 වැනි දින දරන පිඹුරේ බෙද වෙන් කර නිරූපනය කර ඇති කැබලි අංක 36A 36 B බිම් කොටස්.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් වස්ගමුව ක්ලෝතින් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ප්‍රදානය කරන ලද වාරික ණයක් ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් වාසියට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධණ විසින් 2011 ජූලි මස 27 වැනි දින සහතික කරන ලද අංක 4095 දරන

උකස්කරය ද, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හල්ලෝලුව විසින් 2013 පෙබරවාරි මස 26 වැනි දින අංක 3302 දරන උකස්කරය ද, 2015 මැයි මස 21 වැනි දින සහතික කරන ලද අංක 3567 දරන උකස් බැඳුම් මගින් වස්ගමුව ක්ලෝතින් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු/ උකස්කරු වශයෙන් සහ රවීන්ද්‍ර පුෂ්පකුමාර අබේසේකර සහ නානායක්කාර බෝපේ යමුනා තිසරනී වීරතුංග යන අය වස්ගමුව ක්ලෝතින් (ප්‍රයිවට්) ලිමිටඩ් හි හිමිකරුවන්, අධ්‍යක්ෂවරුන් වශයෙන් එකී සමාගම පාලනය සහ කළමණාකරණය කරන අතර ඒ අනුව සමාගමේ ආයතනික වැස්ම නිරාවරණය කළහොත් එවිට ඉහත කී රවීන්ද්‍ර පුෂ්පකුමාර අබේසේකර සහ නානායක්කාර බෝපේ යමුනා තිසරනී වීරතුංග යන අය හැටන් නැෂනල් බැංකුව පීඑල්සී විසින් වස්ගමුව ක්ලෝතින් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ප්‍රදානය කරන ලද මුල්‍ය සත්‍ය ප්‍රගතිලාභීන් ලෙසින් ඉහත කී උකස්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති බැවින්, ඉහත සඳහන් දේපළ වර්ෂ **2022 ක් වූ ඔක්තෝබර් මස 27 වැනි දින පෙරවරු 11.00 ට සහ පෙ. ව. 11.15 ට** අදාල දේපළ පිහිටි පරිශ්‍රයන්හි දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා කරුණාකර 2022.08.26 වැනි දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රය* සහ 2022.08.31 වැනි දින ''මව්බිම'' ''ඩේලි මිරර්'' සහ ''තිනක්කුරල්'' පුවත්පත් බලන්න.

*දේපළට ප්‍රවිශ්ඨ විය හැකි මාර්ගය.*- කොළඹ සිට බත්තරමුල්ල කඩමංඩිය දක්වා ගමන් කර දකුණට හැරී කි. මී. 2ක් පමණ වික්‍රමසිංහපුර නිවාස සංකීර්ණයට ප්‍රවිශ්ඨ වන පාර දක්වා ගමන් කර වමට හැරී ITN රූපවාහිනී මධ්‍යස්ථානය පසු කළ වහාම දකුණට හැරී තාර සහ කොන්ක්‍රීට් දමා නිම කරන ලද ITN රූපවාහිනී මධ්‍යස්ථානය මායිමේ පිහිටි හෝකන්දර දෙසට ගමන් කරන පාරේ මීටර් 150ක් පමණ ගමන් කිරීමෙන් හමුවන 1 වන පටුමගට පෙර මෙම දේපළ පිහිටා ඇත.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි. (1) ගැණුම් මුදලින් 10%ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 2,000 ක් ද, (6) වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 3,500ක් ද වේ. ගැණුම් මිළේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල් ගෙවීමට අපොහොසත් වුවහොත් ගෙවන ලද 10% ක මුදල ආපසු නොගෙවනු ලබන අතර දේපළ නැවත විකිණීමේ අයිතිය බැංකුව සතු ය.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID -19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි නිර්දේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

දේපළ පිළිබඳ වැඩි විස්තර දැනගැනීම පිණිස කොළඹ 10, ටී. බී. ජයා පාරේ වරිපනම් අංක 479 දරන පරිශ්‍රයේ පිහිටි හැටන් නැෂනල් බැන්ක් පී එල් සී හි ජ්‍යෙෂ්ඨ කළමණාකරු - අයකිරීම් ගෙන් විමසන්න. දුරකථන අංක 011- 2661828 හෝ 0112 661866 අමතන්න.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

134 බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 2873656, 011- 2871184,
0777 672082 0777449452.

09-416

---

## සෙලාන් බැංකුව පීඑල්සී - පරණ යොන් වීදිය ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම දේපල කොළඹ 15, දිලූ එන්ටර්ප්‍රයිස් යන නාමය, විලාශය සහ අභිධානය යටතේ ස්වාමිත්වයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන කොළඹ 15 පදිංචි පෙරියසාමි සිවකුමාර් යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බංකුව වෙත සුරක්ෂිත කර ඇත.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාත හේවාහැට ගන්දහය කෝරළේ (දකුණ) සහ තලාතුඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ බටුවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බටුවත්ත පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ආර්. මරදවෙල විසින් සාදන ලද 2016.08.08 දිනැති අංක 2016 -80 දරන සැලැස්මේ නිරූපණය වන පින්නගොල්ලවත්ත සහ නිකතැන්නවත්ත දැන් පින්නගොල්ල පාක් නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කළ (බලයලත් මිනින්දෝරු ඒ. ආර්. මරදවෙල විසින් සාදන ලද 2015.11.26 දිනැති අංක 2015-107 දරන සැලැස්මේ සඳහන් ලොට් 1 සහ 2 හි එකතු කිරීමක් සහ නැවත මැනීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 2016- 80 දරන සැලැස්ම අනුව අක්කර දෙකයි රූඩ් එකයි පර්චස් දොළහයි දශම නවයයි හයක් (අ. 2, රූ. 1, පර්. 12.96) විශාල ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

ඉහත සඳහන් දේපළ **2022 ඔක්තෝබර් මස 19 වැනි දින පෙරවරු 9.30** ට සෙලාන් බැංකුව, පීඑල්සී අංක 90, ගාලු පාර, කොළඹ 03, දරන ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම.* - මහනුවර සිට අම්පිටිය මාර්ගය ඔස්සේ කි. මී. 10 ක පමණ දුරක් ගොස් තලාතුඔය නගරය දක්වා පැමිණ තවත් මීටර් 200ක් පමණ ගිය විට ඇති Y හන්දිය දක්වා ගොස් වම්පසට ඇති මාරස්සන පාරට හැරී තවත් මීටර් 600 ක පමණ දුරක් ගොස් සිංහාරගම හන්දිය දක්වා පැමිණ (බුද්ධ ප්‍රතිමාවක් ද පිහිටා ඇත) සිංහාරගම පාරට හැරී තවත් මඳ දුරක් ගිය විට අදාල දේපළ මාර්ගයේ දකුණු පසින් ප්‍රධාන මාර්ගයේ සිට 2 වන ඉඩම් කොටස ලෙස පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.* - *රජයේ ගැසට් පත්‍රයේ* 2019.01.11 වැනි දින පළ වී ඇති අතර, ලංකාදීප, ඩේලිමිරර් සහ තිනකුරල් පුවත්පත්වල 2019.01.11 වැනි දින පළවී ඇත.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පනවන ලද කෝවිඩ් 19 උපදෙස් සහ නීතිරීතිවලට අනුකූලව මෙම වෙන්දේසිය පවත්වනු ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 3,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 1,500, 6. සියලුම ප්‍රචාරක වියදම්, 7. ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුයි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

වැඩි විස්තර සඳහා විමසන්න. සහකාර සාමාන්‍යාධිකාරී (නීති), සෙලාන් බැංකුව පිඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03 .

දුරකථන අංක 011- 2456480, 2456481.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත් කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටි. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකථන අංක 011 - 3068185, 011- 2572940.

09-399

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - බොරැල්ල ශාඛාව**

1990 අංක 04 දරන පනත මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ පනතේ 4 වැනි වගන්තිය යටතේ වෙන්දේසියේ විකුණුම් දැන්වීම

හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි වාසියට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ආර්. ෆායිස් විසින් ලියා සහතික කරන ලද අංක 3631 හා 2018.03.19 දින දරන උකස් බැඳුම්කරය මගින් රාජපක්ෂ වාසල මුදියන්සේලාගේ කෝරළේ ගෙදරට කල්‍යාණි ලංකා රාජපක්ෂ ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ අයවිය යුතු ණය මුදල්, සියලු ගෙවීම් හා වෙන්දේසි ගාස්තු ඇතුළු සියලුම වියදම් මුදල් අයකර ගැනීම සඳහා මෙහි පහත සඳහන් දේපළ හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. වෙතින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් **2022 ඔක්තෝබර් මස 17 වැනි දින පෙ. ව. 11.30** ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය COVID -19 ක්‍රියා පිළිවෙලට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලවම පවත්වනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ අධිකාරි පත්තුවේ, කැළණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ සීමාව තුළ අංක 259 ඒ, ඊරියවැටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ඊරිවැටිය ගමේ පිහිටි දේවසුමිත්තාරාම පාර වරිපනම් අංක 28/5 දරන දෙල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු වී. පී. විතාන විසින් මැන සාදන ලද අංක 209/2018 හා 2018.02.22 දින දරන පිඹුරේ ලොට් 2 ඒ/1 දරන ඉඩම ප්‍රමාණයෙන් පර්චස් දහ අට (පර්. 18) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ පළතුරු ගොඩනැගිලි ඇතුළුව සියලු දේ ද වේ.

*වැඩි විස්තර සඳහා* .- 2022.06.24 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද, 2022.07.01 මව්බිම, ඩේලිමිරර් සහ තිනක්කුරල් පුවත්පත් වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසෙන මාර්ගය* .- කිරිබත්ගොඩ නගර මධ්‍යයේ සිට ඊරියවැටිය පාර ඔස්සේ (මාර්ග අංක 983) මීටර් 400ක් පමණ දුරක් ගමන් කර වමට හැරී දේවසුමිත්‍රාරාම මාවතට පිවිස මීටර් 100ක් පමණ ඉදිරියට ගොස් දකුණට හැරී (පන්සල අසලින්) මීටර් 100ක් පමණ ගමන් කර පාරේ වම්පස පිහිටා ඇති විෂයගත දේපල වෙත ළඟා විය හැක.

*ගෙවීමේ ක්‍රමය.* -

1. ගැණුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000ක් ද,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකය හා මුද්දර ගාස්තු ද.

ගැණුම් මිලෙන් 90% ක් වූ මුදල විකුණුම් දින 30ක් ඇතුලත හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. වෙත ගෙවා නිම කළ යුතු යි. ප්‍රධාන කළමණාකරු (අයකිරීම්) හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. අංක 479 ටී. බී. ජයා මාවත, කොළඹ 10 ලිපිනය වෙත ගෙවිය යුතු ය.

දුරකතන අංක : 011- 2661866, 011- 2661828

හිමිකම් ඔප්පුව සහ වෙනත් අදාල විස්තර ඉහත ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද මුදල් දින තිහක් (30) ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතියක් ඇත.

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

ඊ. එස්. රාමනායක,<br>
උසාවි කොමසාරිස්,<br>
බලයලත් වෙන්දේසිකරු සහ තක්සේරුකරු,<br>
සාමවිනිසුරු (මුළු දිවයිනටම)

අංක 11/55, බෝගහවත්ත,<br>
කුඩාබුත්ගමුව, අංගොඩ.<br>
දුරකථන අංක 011-2053286/072 3207533 , 076 - 9217329.

09-401

---

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - මොරටුව ශාඛාව

### 1990 අංක 04 දරන පනත මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ පනතේ 4 වැනි වගන්තිය යටතේ වෙන්දේසියේ විකුණුම් දැන්වීම

හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් කරුණාකලගේ ජොහැන් ද සිල්වා වෙත ප්‍රදානය කරන ලද වාරික ණයක් ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි වාසියට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්. පෙරේරා විසින් ලියා සහතික කරන ලද අංක ටීආර්. 147 හා 2016.03.02 දින දරන සහ අංක ටීආර්. 210 හා 2017.02.22 දින දරන උකස් බැඳුම්කර මගින් කරුණාකලගේ ජොහැන් ද සිල්වා ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ අයවිය යුතු ණය මුදල් සියලු ගෙවීම් හා වෙන්දේසි ගාස්තු ඇතුළු සියලුම වියදම් මුදල් අයකර ගැනීම සඳහා මෙහි පහත සඳහන් දේපළ, හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. වෙතින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් **2022 ඔක්තෝබර් මස 18 වැනි දින පෙ. ව. 11.30** දේපල පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය COVID -19 ක්‍රියා පිළිවෙලට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලවම පවත්වනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සීමාව තුල 553 ඒ - මොරටුවැල්ල උතුර ග්‍රාම නිලධාරී වසම තුළ රාවතාවත්තේ පිහිටි කැඩැස්තර සිතියම් අංක 520214 හි අංක 04 දරන ඉඩම ප්‍රමාණයෙන් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි දෙකයි එකයි දෙක (හෙක්. 0.0212) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු ගොඩනැගිලි ඇතුළුව සියලු දේ ද වේ.

*වැඩි විස්තර සඳහා* .- 2022.08.19 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද, 2022.08.26 මව්බිම, ඩේලිමිරර් සහ තිනක්කුරල් පුවත්පත් වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසෙන මාර්ගය* .- මොරටුව නගර සභා ඔරලෝසු කණුව දෙසින් (කොළඹ ගාල්ල පරණ පාර) කෙලින් වීදිය දිගේ මීටර් 360ක් පමණ දුරක් ගිය විට (ඉන්ධන පිරවුම් හල හෝ දින පොල පසු කර යද්දී) දකුණු පැත්තට වන්නට අදාල විෂය වස්තුවේ ඉදිරිපස පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* -

1. ගැණුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000ක් ද,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකය හා මුද්දර ගාස්තු ද.

ගැණුම් මිලෙන් 90% ක් වූ මුදල විකුණුම් දින 30ක් ඇතුලත හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. වෙත ගෙවා නිම කළ යුතු යි. ප්‍රධාන කළමණාකරු (අයකිරීම්) හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. අංක 479 ටී. බී. ජයා මාවත, කොළඹ 10 ලිපිනය වෙත ගෙවිය යුතු ය.

දුරකතන අංක : 011- 2661866, 011- 2661828

හිමිකම් ඔප්පුව සහ වෙනත් අදාල විස්තර ඉහත ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද මුදල් දින තිහක් (30) ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතියක් ඇත.

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ තක්සේරුකරු,
සාමවිනිසුරු (මුළු දිවයිනටම)

අංක 11/55, බෝගහවත්ත,
කුඩාබුත්ගමුව, අංගොඩ.
දුරකථන අංක 011-2053286/072 3207533 , 076 - 9217329.

09-402

---

**පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පීඑල්සී**

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසියයි

පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ වර්ෂ **2022 ක් වූ ඔක්තෝබර් මස 19 වැනි දින පෙ. ව. 11.30** ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, (අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ) කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, උඩුගහ පත්තුවේ, සීතාවකපුර නගර සභා සීමාව තුළ, අවිස්සාවේල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අවිස්සාවේල්ල කොටහැර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පිහිටි (හුසේනි එස්ටේට් හි කොටසක්) ''දියහොඳ එස්ටේට්'' නමැති ඉඩමට බලයලත් මානක ඒ. ජයසූරිය විසින් මැන සාදන ලද (බලයලත් මානක කේ. ඩී. ඩබ්ලිව්. ඩී. පෙරේරා විසින් වර්ෂ 2016.01.06 දිනැති පිටසන් කරන ලද) වර්ෂ 2002.03.16 දිනැති අංක 2110 දරන පිඹුරේ ලොට් 1 දරන ඉඩම සහ එහි පිහිටි සියලු දෙය වේ.

විශාලත්වය : (අ. 5, රූ. 3, පර්. 27.90)

ගම්පොල ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. වැගොඩපොල විසින් සහතික කරන ලද වර්ෂ 2018.02.15 වැනි දිනැති අංක 2437 දරන ප්‍රාථමික උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම සිදුකිරීම හේවා වැදිගේ සෝමසිරි සහ හේවා වැදිගේ තිලිණ සඳරුවන් යන අය ''බන්ධනදයීන්/උකස්කරුවන්'' ලෙස ද පැහැර හැර ඇති හෙයින් ද, යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා වර්ෂ 2019.09.27 වැනි දිනැති රජයේ *ගැසට් පත්‍රය*, දිවයින, දි අයිලන්ඩ් සහ වර්ෂ 2019.09.20 දිනැති තිනක්කුරල් පුවත්පත් ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.* - හයිලෙවල් පාර හෝ ලෝ ලෙවල් පාර ඔස්සේ කොළඹ සිට අවිස්සාවේල්ල දක්වා පැමිණෙන්න. අවිස්සාවේල්ල නගරයේ සිට රත්නපුර පාර ඔස්සේ කි. මී. 1ක් පමණ පැමිණෙන විට දකුණු අත පැත්තේ කොටහැර පාර පිහිටා ඇත.

එම මාර්ගයේ මීටර් 275ක් 300ක් යන විට පාර දෙකට බෙදෙන තැනින් දකුණට යන විට අලුතෙන් තනාගෙන යන නිවස හමුවේ. විෂයගත දේපල එයට වම්පසින් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

(1) ගැණුම් මුදලේ 10% ද (සියයට දහයක්),
(2) පලාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ද (සියයට දෙකහමාරක්),
(4) ප්‍රචාරක වියදම් හා අනෙකුත් ගාස්තු ද,
(5) විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු රු. 5,000 ක් ද,
(6) ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 1,500 සහ වෙන්දේසිය සඳහා වියදම් වූ අනෙකුත් ගාස්තු ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුලත දී නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාල තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු - නීති, පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී. ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011 - 4667227/ 011- 4667245.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
සහ බලයලත් වෙන්දේසිකරු.

අංක 134,
බැද්දගාන පාර, කෝට්ටේ.
දුරකථන අංක 011-2873656, 0777 672082
ෆැක්ස් : 011 -2871184.

09-366

**පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පීඑල්සී**

1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසියයි

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දක්වෙන දේපළ වර්ෂ **2022 ක් වූ ඔක්තෝබර් මස 28 වැනි දින පෙ. ව. 11.00** ට එකී දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ (ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ) ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ, රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභා සීමාව තුළ වැලිසර උප කාර්යාලයේ සහ වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මතුමගල - 177 ඒ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මාගම්මන ග්‍රාමයේ පිහිටි පුලිනතලාරාම හරස් පාර වරිපනම් අංක 8/16 දරන ''මදටියගහවත්ත'' නම් වූ ඉඩමට බලයලත් මානක එම්. ඩී. එන්. ටී. පෙරේරා විසින් සාදන ලද 2017 ඔක්තෝබර් මස 20 වැනි දින අංක 6466 දරන සැලැස්මේ නිරූපිත ලොට් A 2 B වශයෙන් ලකුණු කර බෙදා වෙන් කළ ඉඩම සහ ඒ මත පිහිටා ඇති සියලු දේත් සමග මාර්ග අයිතිවාසිකම් ද සමග වේ.

බිම් ප්‍රමාණය පර්. 9.40

*දේපළට පිවිසෙන මාර්ගය* .- කොළඹ සිට කැළණිය දක්වා වන ඒ 1 ප්‍රධාන පාරේ කැලණිය පාලම පසු කර වමට ඇති පැලියගොඩ - පුත්තලම ඒ 3 ප්‍රධාන පාරේ කිලෝමීටර් 8.3 පමණ පසුකළ විට වම් පැත්තේ පුලිනතලාරාම පාර පිහිටා ඇත. එම පාරේ මීටර් 275 ක් පමණ පසුකළ පසු වම් පැත්තට මාගම්මන පාර පිහිටා ඇත. මාගම්මන පාරේ මීටර් 100ක් පමණ පසු කළ විට දකුණු අත පැත්තට මෙම දේපල දක්වා දිවෙන පාර පිහිටා ඇති අතර එම පාරේ කෙළවර දකුණු අත පැත්තේ විෂයගත දේපළ පිහිටා ඇත.

මුතුකරුපන් තිරුවෙල්වකුමාර් බන්ධනදායි/උකස්කරු වශයෙන් ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් ජේ. වඩුතන්ත්‍රී විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2017.11.09 දිනැති අංක 585 දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා වර්ෂ 2022.07.08 වැනි දිනැති රජයේ ගැසට් පත්‍රය ද, වර්ෂ 2022.07.22 වැනි දින දි අයිලන්ඩ්, දිවයින පුවත්පත් සහ වර්ෂ 2022.07.05 වැනි දින තිනක්කුරල් පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

(1) ගැණුම් මුදලේ 10% ද (සියයට දහයක්),
(2) පලාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ද (සියයට දෙකහමාරක්),
(4) ප්‍රචාරක වියදම් ද,
(5) විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද,
(6) ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 1,500 ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුලත දී නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාල තොරතුරු කළමණාකරු - ණය අයකර ගැනීම්, පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී., ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011 - 4667720/ 011- 4667237.

පී. කේ. ඊ. සේනාපති,
බලයලත් වෙන්දේසිකරු.

අංක 134,
බැද්දගාන පාර, කෝට්ටේ.
දුරකථන අංක : 011-2873656, 0777 672082,
ෆැක්ස් : 011 -2871184.

09-367